*සැ. යු*.-2012.11.02 දින පළ වූ අංක 1,783 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,784 - 2012 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2012.11.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1695 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 නොවැම්බර් මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 නොවැම්බර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*)

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1693- B 80662—8,935 (2012/11)
B1-

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය

**උසස් තාක්‍ෂණ ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2013 අධ්‍යයන වර්ෂය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන උසස් ජාතික ඩිප්ලෝමා සඳහා 2011 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල පැරණි හා නව නිර්දේශය යටතේ අ.පො.ස. (උ. පෙළ) සමත් අදාළ සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයැදුම්පත් :*

ආදර්ශ අයැදුම්පත පහත දක්වා ඇත. එම ආදර්ශ අයැදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයැදුම් පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රු. 350 ක මුදලක් කොළඹ මහජන බැංකු උද්‍යාන වීදියේ ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 025-100133397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතන ජංගම ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයැදුම්පත 'අ' කොටසේ සඳහන් ඔබ තෝරා ගත් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්‍ෂණ ආයතනයට හෝ උසස් තාක්‍ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙලවරෙහි ඔබ විසින් අයැදුම් කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය. එක් ආයතනයකට වඩා අයැදුම් කරන්නේ නම් අයැදුම් කරනු ලබන සෑම අයැදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රු. 350 ක වටිනාකමකින් යුත් කුවිතාන්සි සමගින් අයැදුම්පත් ඉදිරිපත් කළයුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම්වලට බැරකරන ලද කුවිතාන්සි සහිත අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් ප්‍රතික්‍ෂේප කෙරේ.

අයැදුම්පත් භාරගන්නා අවසන් දිනට පසු ලැබෙන අයැදුම්පත් ප්‍රතික්‍ෂේප කරනු ලැබේ.

"අ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්‍ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර අයැදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරාගත යුත්තේ "ආ" කොටසෙහි සඳහන් පාඨමාලා ලැයිස්තුව තුලිනි.

*දේශන පැවැත්වෙන ආකාරය :*

පූර්ණකාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද, අර්ධකාලීන පාඨමාලා සඳහා දේශන සති අන්තයේ දිවා කාලයේ ද පැවැත්වේ. සියළුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. අර්ධකාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත අයට පමණක් සීමා කෙරේ.

*පාඨමාලා ගාස්තු :*

පූර්ණ කාලීන පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධකාලීන ඉංග්‍රීසි පාඨමාලා සඳහා සෑම සමාසිකයකටම රු. 4,000 බැගින් අයකරනු ලැබේ. උසස් ජාතික ගණකාධිකරණ පාඨමාලාවේ පළමු වැනි හා දෙවැනි වසර සඳහා සෑම සමාසිකයකටම රු. 2,000 ක් ද, තෙවැනි හා සිව්වැනි වසර සඳහා සෑම සමාසිකයකටම රු. 3,000 ක් ද අයකරනු ලැබේ. උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා අර්ධ කාලීන පාඨමාලාව සඳහා සෑම සමාසිකයකටම රු. 10,000 ක් බැගින් අයකරනු ලැබේ. (වසරකට සමාසික දෙකකි). මෙම ගාස්තු වාර්ෂිකව සංශෝධනයකට ලක් කිරීමේ කොන්දේසියට යටත්ය.

*සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් අනුව තෝරාගත් අයැදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණයකට හා/හෝ සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතු ය. ශිෂ්‍යයන් තෝරාගැනීම මූලිකව උසස් පෙළ විභාගයේ දී ලබාගත් ඒකාබද්ධ ලකුණු හෝ Z-score මත පදනම් වේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා දිනය, වේලාව, ස්ථානය හා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන ආදී විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් ලිපියකින් පෞද්ගලිකව දන්වා එවනු ඇත. සහතිකවල මුල් පිටපත් නොමැති අවස්ථාවල දී සහතික කරන ලද ඡායාපිටපත්, ලියාපදිංචිවීමේ දී මුල් පිටපත් ඉදිරිපත් කරන කොන්දේසිය යටතේ භාරගනු ලැබේ.

*නේවාසික පහසුකම් :*

දෙහිවල හා නයිවල උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් සහ අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ හා මට්ටක්කුලිය උසස් තාක්‍ෂණ ආයතනයන්හි සීමිත කාන්තා/පිරිමි නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම සීමිත පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම්ලත් සිසුන්හට පමණි.

"අ" කොටස

*උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ඒවායේ සංකේත අංක, ලිපිනයන්, දුරකථන අංක හා පාඨමාලා :*

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 01 | උසස් තාක්‍ෂණ ආයතනය, මට්ටක්කුලිය | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15. | 011-2529479<br>011-2521152 | උ. ජා. ඉ. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. ප්‍ර. මි. ස. ඩි., උ. ජා. ගො. සේ. ඉ.ඩි. |
| 02 | උසස් තාක්‍ෂණ ආයතනය, දෙහිවල | වෛද්‍ය පාර, දෙහිවල | 011-2714270<br>011-2738349 | උ. ජා. ග. ඩි (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ව්‍යා. මු. ඩි. උ. ජා. ආ. තා. ඩි., උ. ජා. ස. ස. ක. ඩි. |
| 03. | ගාල්ල උසස් තාක්‍ෂණ ආයතනය, ලබුදූව | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන | 091-2227880<br>091-2246179 | උ. ජා. ඉ. ඩි, උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි (අ. කා), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ප්‍ර. මි. ස. ඩි. උ. ජා. ගො. සේ. ඉ. ඩි. උ. ජා. ස. ස. ක. ඩි. |
| 04. | උසස් තාක්‍ෂණ ආයතනය, මහනුවර | අංක 16, කැප්පෙටිපොල පාර, මහනුවර | 081-2226644<br>081-2232097 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ.ජා. ව්‍යා. ප. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 05. | උසස් තාක්‍ෂණ ආයතනය, කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2224911<br>037-2229583 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා,), උ. ජා. ක. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), |
| 06. | උසස් තාක්‍ෂණ ආයතනය, බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218<br>055-2223818 | උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි, උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි. |
| 07 | උසස් තාක්‍ෂණ ආයතනය, යාපනය | අංක 665/5 වෙරළ පාර, යාපනය | 021-2222595<br>021-2239803 | උ. ජා. ඉ. ඩි., උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා, තො. තා. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි. |
| 08 | උසස් තාක්‍ෂණ ආයතනය, නයිවල | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519<br>033-2292544 | උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ආ. තා. ඩි. |
| 09 | හාඩි උසස් තාක්‍ෂණ ආයතනය, අම්පාර | ඉඟිනියාගල පාර, අම්පාර | 063-2222056<br>063-2223035 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජ. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 10 | උසස් තාක්‍ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | කන්නියා පාර, වරෝධය නගර්, ත්‍රිකුණාමලය | 026-3262937 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (අ. කා.) |

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 11 | කෑගල්ල උසස් තාක්‍ෂණ ආයතනය, කෑගල්ල | බංඩාරනායක මාවත, කෑගල්ල | 035-2221297<br>035-2221713 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 12 | උසස් තාක්‍ෂණ, ආයතන අංශය, අනුරාධපුරය | අංක 388/35 හරිස්චන්ද්‍ර මාවත අනුරාධපුරය | 025-2234417 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), |
| 13 | උසස් තාක්‍ෂණ ආයතනය, රත්නපුරය | නව නගරය, රත්නපුරය | 045-2230780 | උ. ජා. ග. ඩි. (අ. කා.) |
| 14 | උසස් තාක්‍ෂණ ආයතනය අංශය, සමන්තුරේ | මහ වීදිය, සමන්තුරේ | 067-2261304 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 15 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, මඩකලපුව | මල්ටි පර්පස් ගොඩනැගිල්ල, කෝවිල් කුලම් නැගෙනහිර, අරයාම්පති | 065-2247519 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (අ. කා.), |
| 16 | උසස් තාක්‍ෂණ ආයතනය තංගල්ල | යායවත්ත, නෙටොල්පිටිය තංගල්ල | 047-2240267<br>091-2246179 | උ. ජා. ග. ඩි. (අ. කා.) |

*සැලකිය යුතුයි* :

(1) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාව සඳහා අයදුම්කරුවන් සතියේ දිනයන්හි පාඨමාලාවන් සඳහා සහභාගි වීමට නිදහස් විය යුතු අතර සති අන්තයේදී ද අවශ්‍යතා අනුව පාඨමාලා කටයුතුවලට සහභාගී වීමට හැකි විය යුතු ය.

(2) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාව පළමු සහ දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ ද, තෙවන, සිව්වන වසර සති අන්තයේ ද දේශන පවත්වනු ඇත.

(3) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (පූර්ණකාලීන) පළමු හා දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ දී දේශන පවත්වනු ලබන අතර තෙවන වසර සඳහා දේශන පවත්වනු ලබන්නේ සති අන්තයේ දී ය.

(4) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ අයදුම්කරන්නන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත්ව තිබීම අනිවාර්ය වේ.

(5) ඒ ඒ පාඨමාලාවන්ට තෝරා ගැනීමේ දී අ.පො.ස. (උ.පෙ.) ඒකාබද්ධ ලකුණු හෝ Z-Score සැලකිල්ලට ගනු ලැබේ.

(6) සුදුසුකම් ලද විභාගයේ දී පාඨමාලාවට අදාළ විෂයයන්ගෙන්/විෂයය ක්ෂේත්‍රයේ සාමාර්ථයක් ලත් අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(7) පූර්ණකාලීන පාඨමාලාව සඳහා වයස අවු. 23ට අඩු අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(8) අදාල උසස් තාක්‍ෂණ ආයතනයක හෝ උසස් තාක්‍ෂණ ආයතන අංශයක පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවම වශයෙන් අයදුම්කරුවන් 25ක් සිටිය යුතු ය.

(9) අදාල උසස් තාක්‍ෂණ ආයතනයක හෝ ආයතන අංශයක පැවැත්වෙන පාඨමාලාවක් සඳහා නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා යන අයදුම්පත් ප්‍රමාණයක් වේ නම් එම ආයතනය විසින් පවත්වන යෝග්‍යතා විභාගයක් හරහා නියමිත ශිෂ්‍ය සංඛ්‍යා බඳවා ගනු ලැබේ.

(10) කුමන හේතුවක් නිසා හෝ තෝරා ගැනීමෙන් පසු පූර්ණ කාලීන සිසුන් අදාල පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්‍ෂණ ආයතනයකට හෝ ආයතනය අංශයකට මාරු කරනු නොලැබේ.

### " *ආ* " කොටස

පාඨමාලාවලට ඇතුළත් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දැක්වේ :-

01. **උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2යි.**
**(සිවිල්/විදුලි/යාන්ත්‍රික ඉංජිනේරු)**
**උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්ෂණ ඩිප්ලෝමා (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි**
**උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය* :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය (නව නිර්දේශය) යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් තුනම එක්වරදී සමත්ව තිබිය යුතුය;

*සහ*

(ii) අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

02. *උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 4යි*

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) අ.පො.ස. (උ/පෙළ.) විභාගය (පැරණි නිර්දේශය) යටතේ ශුද්ධ ගණිතය හෝ ගණකාධිකරණය විෂයය ඇතුළත්ව විෂයයන් හතරෙන්ම සාමාර්ථය ලබා තිබීම. මින් විෂයයන් දෙකකට එම අවස්ථාවේම හෝ වෙනත් අවස්ථාවක දී හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

අ.පො.ස. (උ./පෙළ.) විභාගයේ දී ශුද්ධ ගණිතය හෝ ගණකාධිකරණ විෂයයන්ට සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය;

*හෝ*

(ii) අ. පො. ස. (උ/පෙළ) විභාගය (නව නිර්දේශය) යටතේ සංයුක්ත ගණිතය/ගණකාධිකරණය විෂයය ඇතුළුව විෂයයන් තුනම එක්වරකදී සාමාර්ථය ලබා තිබිය යුතුය. මෙම විෂයයන් තුනෙන් විෂයයන් දෙකකට සම්මාන ලබා තිබිය යුතුය.

අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය/ගණකාධිකරණය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ. පො. ස. (සා./ පෙළ.) විභාගයේදී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.;

*හෝ*

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමත්වීම;

*සහ*

(iv) අ.පො.ස. (සා./පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

**2. 1 උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි (අර්ධ කාලීන) - කාලය වසර 4 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය (පැරණි නිර්දේශය) යටතේ එක් අවස්ථාවක දී විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ එක් අවස්ථාවකදී විෂයයන් තුනකින් සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමාර්ථයක් ලබා තිබීම;

හෝ

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) සාමාර්ථයක් ලබා තිබීම, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;

සහ

*ප්‍රායෝගික පළපුරුද්ද* - අයදුම්කරු රජයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටින අයෙකු විය යුතුය.

පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එහි II වසරට බඳවා ගැනීම සෙසු අවශ්‍යතාවන් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත.

(i) ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ජාතික ඩිප්ලෝමාව/ව්‍යාපාර මූල්‍ය/ව්‍යාපාර පරිපාලනය,
(ii) උසස් ජාතික වාණිජ/කළමනාකරණ ඩිප්ලෝමා හෝ එහි II වසර පරීක්ෂණය,
(iii) විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිය හෝ වාණිජවේදී උපාධිය හෝ විද්‍යාවේදී (ගණකාධිකරණ) උපාධිය,
(iv) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ I සහ II පරීක්ෂණය,
(v) වරළත් කළමණාකාරිත්ව හා ගණකාධිකරණ ආයතනයේ I සහ II පරීක්ෂණය,
(vi) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ III අදියර පරීක්ෂණය

**03. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා - උ. ජා. ක. ඩි (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

**සහ**

**උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා - උ. ජා. ස. ස. ක. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ.පෙළ.) විභාගය පැරණි නිර්දේශය යටතේ එක් වරක දී විෂයයන් හතරකින් සමත්වීම හෝ නව නිර්දේශය යටතේ එකවරක දී විෂයයන් තුනකින් සමත්වීම සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

**04. උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ව්‍යා. ප. ඩි. (පූර්ණ කාලීන) — කාලය වසර 2 1/2 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) අ. පො. ස. (උ./පෙළ) විභාගය (පැරණි නිර්දේශය) යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මුල්‍ය සහ ගණකාධිකරණය යන විෂයයන් තුනෙන් අ. පො. ස. (උ./පෙ.) විභාගය (පැරණි නිර්දේශය) සාමාර්ථයක් හෝ ඉහත සඳහන් විෂයයන් දෙකකින් සහ ශුද්ධ ගණිතය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, සිංහල, දෙමළ, ඉංග්‍රීසි, තර්ක ශාස්ත්‍රය හෝ ඉතිහාසය, ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන් අතුරෙන් එක් විෂයයකින්ද, සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(ii) අ. පො. ස. (උ/පෙළ) විභාගය (නව නිර්දේශය) යටතේ ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ අ. පො. ස. (උ/පෙළ) විභාගය (නව නිර්දේශය) ඉහත විෂයයන් දෙකක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හා ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයයන් තුනකින් එක්වරකදී සාමාර්ථය ලබා තිබීම.

*හෝ*

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සමාර්ථයක් ලබා තිබීම;

*සහ*

(iv) අ. පො. ස. (සා./පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සමාර්ථයක් ලබා තිබීම.

**05. උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. (පූර්ණ කාලීන - කාලය වසර 3යි/අර්ධ කාලීන - කාලය වසර 2 1/2යි)**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය. :-*

(i) අ.පො.ස. (උ./පෙළ.) විභාගය (පැරණි නිර්දේශය) යටතේ විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(ii) අ.පො.ස. (උ./පෙළ) විභාගය (නව නිර්දේශය) යටතේ විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම;

*සහ*

(iii) අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*සහ*

*සැලකිය යුතුයි :-*

(අර්ධ කාලීන සිසුන් සඳහා පමණක්), තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධ රැකියාවක නිරත විය යුතුය.

**06. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්මය) - උ. ජා. තා. ඩි. (කෘෂි) (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය :-*

(i) අ.පො.ස. (උ./පෙළ.) විභාගය (පැරණි නිර්දේශය) යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, හා සත්ත්ව විද්‍යාව යන විෂයයන් අතරින් දෙකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(ii) එක් වතාවක දී අ.පො.ස. (උ./පෙළ.) විභාගය (නව නිර්දේශය) යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව විෂයයන් තුනකින් සමත්වී තිබීම;

*සහ*

(iii) අ.පො.ස. (සා./පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**07. උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ඉ. ඩි. (පූර්ණ කාලීන - කාලය වසර 3යි./අර්ධ කාලීන - කාලය වසර 2 1/2යි.)**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී (පැරණි නිර්දේශය) යටතේ විෂයයන් හතරකින් සාමාර්ථය සහ
අ. පො. ස. (සා./පෙළ) විභාගයේදී ඉංග්‍රීසි සාහිත්‍ය හෝ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ "සී" සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(ii) අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී (නව නිර්දේශය) යටතේ විෂයයන් තුනකින් සාමාර්ථය සහ අ.පො.ස. (සා./පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍යය හෝ ඉංග්‍රීසි භාෂාව විෂයය සඳහා "සී" සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(iii) ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි);

*හෝ*

(iv) අ. පො. ස (උ. පෙළ) විභාගයේදී (නව නිර්දේශය) යටතේ විෂයයන් තුනකින් සාමාර්ථය සහ අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා 'සී' සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(v) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී (නව නිර්දේශය) යටතේ විෂයයන් තුනකින් සාමාර්ථය සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාණිජ කර්මාන්ත සහ වැඩිදුර අධ්‍යාපනය සඳහා වන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.

**08. උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා- උ. ජා. ව. මූ. ඩි - (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය :-*

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය (පැරණි නිර්දේශය) යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මූල්‍ය, ගණකාධිකරණය ඇතුළු විෂයයන් හතරකින් එක් වරක දී සමත් වී තිබීම;

*හෝ*

(ii) අ. පො. ස. (උ. පෙළ.) විභාගය (නව නිර්දේශය) යටතේ ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් දෙකක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව හෝ සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එක්වරක දී විෂයයන් තුනකින් සමත්ව තිබීම;

*හෝ*

(iii) ගණකාධිකරණ ශිල්පීය හා පුහුණු ආයතනයේ ජාතික සහතික පත්‍ර විභාගය සමත් වී තිබීම;

*සහ*

(iv) අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**09. උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමා - උ. ජා. ආ. තා. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය (නව නිර්දේශය) යටතේ ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂයය ධාරාවන් යටතේ විෂයයන් තුනම එක් වරක දී සමත් ව තිබිය යුතුය;

*සහ*

(ii) අ. පො. ස. (උ. පෙළ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

සටහන :

1. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය 2008 ඔක්තෝබර් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 46/90 (iii) අනුව පිළිගත් විශ්ව විද්‍යාලයක වානිජ විද්‍යාවේදී උපාධිය සාමාන්‍ය සාමාර්ථයට සමානව පිළිගෙන ඇත.
2. ඔබගේ සුදුසුකම්වලට අනුව ඔබ ප්‍රවේශය සඳහා සලකා බැලීමට කැමති පාඨමාලා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙලින් සඳහන් කරන්න.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට 2012 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2012.11.30 වේ.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.

320, ජනවතු පියස, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
Web site : www.sliate.net

*Office use only* – Course Number :.........................................

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION**

*APPLICATION FORM FOR ADMISSION TO HIGHER NATIONAL DIPLOMA COURSES EXCEPT HIGHER NATIONAL DIPLOMA IN ENGINEERING/QUANTITY SURVEYING/BUILDING SERVICES ENGINEERING*

| *Name of the Course* | *Order of Preference* |
|---|---|
| 1. ............................ | ........................................... |
| 2. ............................ | ........................................... |
| 3. ............................ | ........................................... |

1. Name with initials :————.
2. Name/Names denoted by Initials :————.
3. Address :————.
4. Date of Birth :
   Year :————., Month :————., Date :————.

   Age (as at 01.01.2012) :

   Years :————., Months :————., Days :————.

5. National Identity Card No. :————.

6. Sex : Male/Female

7. Administrative District :————. Contact Number :————.

8. (i) Results of GCE (A/L) Examination (on or before 2011)

Year :————, Index No. :————. Medium :————.

| *Pass Subjects* | *Grade* |
|---|---|
| 1. ...................................... | ...................................... |
| 2. ...................................... | ...................................... |
| 3. ...................................... | ...................................... |
| 4. ...................................... | ...................................... |

If under new syllabus indicate pass or fail in the general paper :————.

Aggregate/Average marks or Z-score of the above examination, issued by the Department of Examination :————.

(ii) Results of GCE (O/L) Examination :————.

Year :————. Index No.:————. Medium :————.

| *Subject* | *Grade* | *Subject* | *Grade* |
|---|---|---|---|
| 1. ...................................... | ...................................... | 6. ...................................... | ...................................... |
| 2. ...................................... | ...................................... | 7. ...................................... | ...................................... |
| 3. ...................................... | ...................................... | 8. ...................................... | ...................................... |
| 4. ...................................... | ...................................... | 9. ...................................... | ...................................... |
| 5. ...................................... | ...................................... | 10. ...................................... | ...................................... |

9. Highest Qualification in English as a subject :————.

10. Details of Occupation : Date of Appointment :————.
(only for part-time/weekend courses)

Post :————.
E. P. F. Number :————.
Place of Work and Address :————.

I hereby declare that I am not following any other full-time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that I concurrently follow a full-time course at any other state institution. I hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————,
Signature of Applicant.

Date :————.

(The Bank receipt for Rs. 350 payable to SLIATE should be annexed).

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION (SLIATE)**

***Admission of students to the Higher National Diploma in Engineering (HNDE)/ Higher National Diploma in Quantity Surveying/ Higher National Diploma in Building Services Engineering Courses***

***Academic Year - 2012/2013***

| *Name of the Course* | *Order of Preference* |
|---|---|
| 1. ............................ | ........................................... |
| 2. ............................ | ........................................... |
| 3. ............................ | ........................................... |

01. Name with initials :

02. Names denoted by initials :

03. National Identity Card No. :

04. Date of Birth :

05. Sex : Male Female

06. Permanent Address :
(Within the box below)

07. Administrative District :

08. Field of Engineering in order of preference :

| | |
|---|---|
| 1st Preference | |
| 2nd Preference | |
| 3rd Preference | |

09. Result for English Language at the G. C. E. (O/L) :

| *Year* | *Index No.* | *Grade* |
|---|---|---|
| | | |

10. Result of the Best Attempt at the G. C. E. (A/L) Examination (on or before 2011) :

| *Subject* | *Grade* |
|---|---|
| 1. Combined Mathematics | |
| 2. Physics | |
| 3. Chemistry | |
| 4. Common General Test | |
| Z-score | |

Year | Index No. | Medium

| Attempt | 1st | | 2nd | | 3rd | |
|---|---|---|---|---|---|---|

I hereby declare that I am not following any other full-time course of study in any other state institution.

I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that I concurrently follow a full-time course at any other state institution. I certify that the information furnished here in is true and accurate to the best of my knowledge.

________,
Signature of Applicant.

Date :————.

(The Bank receipt for Rs. 350 payable to SLIATE should be annexed).

11-428

---

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු :

වගුව - අංක 01 — බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පිරවීමට තිබෙන පුරප්පාඩු ගණන* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | සැලසුම් ශිල්පී | 90 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |
| 2. | ඡායා රේඛනමිතික ශිල්පී | 09 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |
| 3. | දුරස්ථ ග්‍රහන කාර්මික ශිල්පී | 01 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පිරවීමට තිබෙන පුරප්පාඩු ගණන* | *බඳවාගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 4. | ගුවන් ඡායාරූප ශිල්පී හා රසායනාගාර කාර්මික ශිල්පී | 02 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |
| 5. | පිඹුරු වර්ණ මුද්‍රණ ශිල්පී | 04 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |
| 6. | ලිතෝ මුද්‍රණ ශිල්පී | 01 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |

1.2 තනතුරුවල රාජකාරි ස්වභාවය :

වගුව - අංක 02 - තනතුරුවල රාජකාරි ස්වභාවය

| *අනු අංකය* | *තනතුරු නාමය* | *රාජකාරි ස්වභාවය* |
|---|---|---|
| 1. | සැලසුම් ශිල්පී | * සිතියම් නිෂ්පාදනය හා ඊට අදාළ තාක්‍ෂණ කටයුතු, මැනුම් පිළිබඳ මූලික හා අවසන් කටයුතු හා ඊට ආදළ ලේඛන පවත්වාගෙන යාම |
| 2. | ඡායාරේඛනමිතික ශිල්පී | * ගුවන් ඡායාරූප ආධාරයෙන් පරිගණක ආශ්‍රයෙන් සිතියම් සැකසීම |
| 3. | දුරස්ථග්‍රහන කාර්මික ශිල්පී | * ගුවන් ඡායාරූප හා චන්ද්‍රිකා දත්තයන්ගෙන් අර්ථ නිරූපනය හා විශ්ලේෂණය හා එමගින් සිතියම් සැකසීම, ඒවා පරිගණකගත කිරීම, අවශ්‍ය දත්ත ලබා දීම. |
| 4. | ගුවන් ඡායාරූප ශිල්පී හා රසායනාගාර කාර්මික ශිල්පී | * ගුවන්ගත වී ත්‍රිමාණික ඡායාරූප ගැනීම සහ එම ඡායා ඵලකයන්ගේ විකාශනික කටයුතු සිදු කිරීමත් එම ඡායා පටය ආධාරයෙන් ඡායාරේඛන සඳහා අවශ්‍ය වන ඵලකයන් සැකසීම, විශාලිත ඡායාකරන මුද්‍රණ පිටපත් සෘජුකරණ ඡායාපිටපත් සහ ස්පර්ශිත මුද්‍රණ පිටපත් සකස් කිරීම |
| 5. | පිඹුරු වර්ණ මුද්‍රණ ශිල්පී | * පරිගණක භාවිතයෙන් සිතියම් හා පිඹුරු සැකසීමට අවශ්‍ය අක්‍ෂර හා ඒ ආශ්‍රිත නිර්මාණ සැකසීම හා මුද්‍රණය (සිතියම්කරණය සඳහා Type Setting), පිඹුරු හස්ත මුද්‍රණය (Hand Stamping) සාමාන්‍ය මුද්‍රණ යන්ත්‍ර භාවිතයෙන් විවිධ මුද්‍රණ කටයුතු සිදු කිරීම, කාර්යාලීය සාමාන්‍ය ලිපි ලේඛන පරිගණක මුද්‍රණ කටයුතු හා සාමාන්‍ය යන්ත්‍ර භාවිතයෙන් මුද්‍රණ කටයුතු කිරීම |
| 6. | ලිතෝ මුද්‍රණ ශිල්පී | * සිතියම් මුද්‍රණය කිරීම |

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප.*—

වගුව - අංක 03 -

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| පුහුණු කිරීමේ ශ්‍රේණිය | නොමැත | 1 වසර මාසිකව රු. 12,920<br>2 වසර මාසිකව රු. 13,040<br>* රා. ප. ච. 06/2006 (II) හි 14 වැනි ඡේදයේ 09 වැනි විධිවිධානයට යටත්ව |
| III ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180-6x240-11x320-20x360-රු. 27,885<br>(එම්එන් 3-2006ඒ) | රු. 15,005/- |
| II ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180-6 x 240-11x320-20x360-රු. 27,885<br>(12 වැනි වැටුප් පියවරෙන් ආරම්භ වේ.)<br>(එම්එන් 3 - 2006ඒ) | රු. 17,485/- |

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| I ශ්‍රේණිය | මාසිකව රු. 15,005 -<br>4 x 180 - 6 x 240 -<br>11 x 320 - 20 x 360 - රු. 27,885<br>(23 වැනි වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(එම් එන් 3 - 2006ඒ) | රු. 21,045/- |
| විශේෂ ශ්‍රේණිය | මාසිකව රු. 20,030 -<br>11 x 365 - 18 x 500<br>- රු. 33,045<br>(එම්එන් 7 - 2006ඒ) | රු. 20,030/- |

4.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය. මෙම *ගැසට් නිවේදනයේ* ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

5.0 *සුදුසුකම් .-*

5.1 *මූලික සුදුසුකම් :*

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම;

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ;
(දැනටමත් රජයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

5.2 *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයන් (06) කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම;

සහ

(ආ) සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයන් අතරින් විෂයන් දෙක (02)ක් සහිතව විද්‍යා විෂයන් තුන (03) කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

5.3 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

*සටහන.*-සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 *සාවද්‍ය තොරතුරු සැපයීම.—*

මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගිය හොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

7.0 *විභාග පරිපාටිය.—*

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|
| (i) බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 |
| (ii) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | 100 | 40% | පැය 02 |

7.1 විෂය නිර්දේශය :

(i) *බුද්ධි පරීක්ෂණය :* අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ, ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ii) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :*

*ගණිතය :*
වීජ ගණිතය (අසමානතා, විචල්‍ය, ශ්‍රේණි, ලඝුගණක)
ත්‍රිකෝණමිතිය (සමීකරණ, ත්‍රිකෝණ විසඳීම)
සංඛ්‍යානය (මධ්‍යන්‍යය, මාතය, සම්මත අපගමනය, සම්භාවිතාව)
*භෞතික විද්‍යාව :*
ආලෝකය හා ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය : දර්පන වක්‍ර පෘෂ්ඨ,
ප්‍රිස්ම කාච ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර, අන්වීක්ෂය සහ දුරේක්ෂය)
නිව්ටන් යාන්ත්‍ර විද්‍යාව (අදිශ සහ දෛශික, චලිතය පිළිබඳ නිව්ටන් නියම, ගම්‍යතාවය)

*විවිධ මාතෘකා :*
භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ ආදිය)
ඝණ වස්තුවල කෝණික දෘෂ්ටිය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම.
මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරනු ලබන සිතියම්.

8.0 තේරීම් පරිපාටිය :

8.1 මැනුම්පති විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රථිඵල අනුව ඉහලම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින්, පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන, පළමුව ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල සහ දෙවනුව තනතුර සඳහා පල කරන ලද මනාපය යන කරුණු දෙක අනුව බඳවා ගනු ලැබේ.

8.2 සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

9.0 බඳවා ගැනීම :
පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරාගනු ලබන්නන් දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් පවත්වන දෙවසරක, තාක්ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ පසු තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට පත් කෙරේ.

10.0 අයදුම්පත්‍ර සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතුය. අංක 01 සිට 04 දක්වා ශීර්ෂ 01 පිටුවේද, අංක 04.1 - 09.1 දක්වා ශීර්ෂ 02 පිටුවේද, අංක 09.2 - 10 දක්වා ශීර්ෂ 03 පිටුවේද, අංක 11 - 13 දක්වා ශීර්ෂ 04 පිටුවේද, අංක 14 - 15 දක්වා ශීර්ෂ 05 පිටුවේද ඇතුලත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින්ද නියමිත දිනට හෝ පෙර ඉදිරිපත් කල යුතු වේ.

(ඇ) ඉල්ලුම්පත් සකස් කල යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

(ඈ) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ඉ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

සැ. යු. : විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10.1 *ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියළු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට මැනුම්පති විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට*

පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්‍ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්‍ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙළවරේ "තාක්‍ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කල යුතුය.

10.3 අයදුම්පත්‍රයේ අපේක්‍ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.0 විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 800 කි. මෙම මුදල කොළඹ 05, කිරුල පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය - දියතලාව වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.0 අයදුම් පත්‍ර යොමු කිරීම :

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2012 නොවැම්බර් මස 30 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මැනුම්පති,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
අංක 150,
නාරාහේන්පිට,
කොළඹ 05.

* සැ. යු. -2012.11.30 දිනෙන් පසුව මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාර ගනු නොලැබේ.

13.0 විභාගයට පෙනී සිටීම :

විභාගයට පෙනී සිටින අපේක්‍ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්‍ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්‍ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතුය.

14.0 අපේක්‍ෂකයන්ගේ අනන්‍යතාවය :

විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) තැපැල්පති විසින් නිකුත් කර ඇති වලංගු හැඳුනුම්පත
(iii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

15.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව මැනුම්පති විසින් තීරණය කරනු ඇත. සියළුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

එස්. එම්. ඩබ්. ප්‍රනාන්දු,
මැනුම්පති,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව.

2012 ඔක්තෝබර් මස 24 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

## ආදර්ශ අයදුම් පත්‍රය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු වලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

01. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය :

| | |
|---|---|
| කොළඹ | |
| දියතලාව | |
| අනුරාධපුරය | |

* විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මධ්‍යස්ථානයේ නම සඳහන් කොටුව තුල ✓ සලකුණ ද අනෙක් කොටු දෙක තුල X සලකුණද යොදන්න

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E )
(දෙන ලද කොටු තුළ සංකේතය/අංකය යොදන්න)

03. බඳවා ගැනෙන තනතුරු අතරින් පත්වීම ලැබීම සඳහා මනාප අනුපිළිවෙල :
වැඩිම මනාපය සහිත තනතුර සඳහා අංක 01 ද මනාපය අඩුවන අනුපිළිවෙල අනුව අනෙකුත් තනතුරු සඳහා 02, 03... අනුපිළිවෙලින් මනාප අංකය සටහන් කරන්න.

| අනු අංකය | තනතුරු නාමය | මනාප අංකය |
|---|---|---|
| 1. | සැලසුම් ශිල්පී | |
| 2. | ඡායා රේඛනමිතික ශිල්පී | |
| 3. | දුරස්ථ ග්‍රහන කාර්මික ශිල්පී | |
| 4. | ගුවන් ඡායාරූප ශිල්පී හා රසායනාගාර කාර්මික ශිල්පී | |
| 5. | පිඹුරු වර්ණ මුද්‍රණ ශිල්පී | |
| 6. | ලිතෝ මුද්‍රණ ශිල්පී | |

04. මුලකුරු සමග නම :————. (මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

————,
අයදුම්කරුගේ අත්සන

04.1 මුලකුරු වලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.

06.1 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

වර්ෂ :————. මාස :————. දින :————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ- M ස්ත්‍රී-F) ☐

08. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්)

08.1 ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය (උපලේඛනය 1 බලන්න)

දිස්ත්‍රික් අංකය ☐ දිස්ත්‍රික්කයේ නම ☐

08.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :————.

09. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

10.1 අ.පො.ස. (සා.පෙළ.) විභාගය පිළිබඳ විස්තර :

පළමුවර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :

වගුව - අංක 01 :

| විෂයය* | ශ්‍රේණිය | විෂයය* | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

* ලබා ඇති ඉහලම ශ්‍රේණියේ සිට ශ්‍රේණි අනුපිළිවෙලින් විෂයයන් සඳහන් කරන්න

————,
අයදුම්කරුගේ අත්සන.

10.2 අ.පො.ස. (සා.පෙළ.) විභාගය පිළිබඳ විස්තර :

දෙවන වර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :

වගුව - අංක 02 :

| විෂයය* | ශ්‍රේණිය | විෂයය* | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

* ලබා ඇති ඉහලම ශ්‍රේණියේ සිට ශ්‍රේණි අනුපිළිවෙලින් විෂයයන් සඳහන් කරන්න.

10.3 අ.පො.ස. (උ.පෙළ.) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :

වගුව - අංක 03 :

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

ඔව් ☐ නැත ☐

11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

————,
අයදුම්කරුගේ අත්සන.

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.
(ඇ) රු. ……… ක් ගෙවා ලබා ගත් ලදුපත අදාල ස්ථානයේ අලවා ඇත.
(ඈ) තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මැනුම්පති විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ………………………………………… නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය …………………… දින මා ඉදිරිපිට දී ඉහත 13 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි) :

15.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ,

වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.

කිසිදු විනය දඬුවමකට ලක්ව නැත/ඇත.

15.2 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
නිල මුද්‍රාව.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**උපලේඛනය 1**

ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 08.1 හි සඳහන් ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම ලේඛනය අදාල වේ. :

| *නගරය/දිස්ත්‍රික්ක නාම* | *නගර/දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| 1. කොළඹ | 01 |
| 2. ගම්පහ | 02 |
| 3. කළුතර | 03 |
| 4. මහනුවර | 04 |
| 5. මාතලේ | 05 |
| 6. නුවරඑළිය | 06 |
| 7. ගාල්ල | 07 |
| 8. මාතර | 08 |
| 9. හම්බන්තොට | 09 |
| 10. කුරුණෑගල | 10 |
| 11. පුත්තලම | 11 |
| 12. අනුරාධපුර | 12 |
| 13. පොළොන්නරුව | 13 |
| 14. බදුල්ල | 14 |
| 15. මොණරාගල | 15 |
| 16. රත්නපුර | 16 |
| 17. කෑගල්ල | 17 |
| 18. අම්පාර | 18 |
| 19. මඩකලපුව | 19 |
| 20. ත්‍රිකුණාමලය | 20 |
| 21. යාපනය | 21 |
| 22. වවුනියාව | 22 |

11-525

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.